**සමාජ ආරක්ෂණ මණ්ඩලය - 2022**

**----------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

සමාජ ආරක්ෂණ මණ්ඩලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාජ ආරක්ෂණ මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මහලේකම් කාර්යාලය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මහලේකම් කාර්යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.
  හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.
- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි

විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහලේකම් කාර්යාලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ක්ෂය කර අවසන් වී තිබුණු නමුත් එදින වන විටත් භාවිතයේ පවතින රු.47,829,179 ක් වූ සන්නිවේදන උපකරණ, ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ වටිනාකම , පරිගණක උපාංග හා යන්ත්‍ර සූත්‍ර හා උපකරණ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි විධිවිධාන පරිදි වෙළඳපොල මිල පදනම් කර සාධාරණ වටිනාකමට මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | 2020 , 2021, 2022 යන වර්ෂයන්හි පැවති කොවිඩ් 19 තත්වයන් හා වියදම් සීමා කිරීම් හේතුවෙන් වත්කම් ප්‍රත්‍යාගණනය කිරීම සිදු කළ නොහැකි වූ අතර, 2024 වර්ෂයේ දී වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කරනු ඇත. | වත්කම් වල වටිනාකම සාධාරණ අගයකට මූල්‍ය ප්‍රකාශන වල දැක්විය යුතුය. |
| (ආ) | 2018 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 11 සඳහා වූ විකල්ප ගිණුම්කරණ ප්‍රමිතියේ (අ) වගන්තිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා ලද මුළු ප්‍රාග්ධන ප්‍රදානය වර්ෂයේ විලම්භිත ආදායම් ලෙස ගිණුම්ගත කල හැකි වුවත් පෙර වර්ෂයන්හි ලද ප්‍රාග්ධන ප්‍රදාන සඳහා වූ ක්‍රමක්ෂය වටිනාකම සමාලෝචිත වර්ෂයේ විලම්භිත ආදායම් ලෙස ගිණුම්ගත කර තිබීමෙන් වර්ෂයේ අතිරික්තය රු. 11,952,597 ක් වැඩියෙන් දක්වා තිබුණි. | 2021 වර්ෂය දක්වා ලද ප්‍රාග්ධන ප්‍රතිපාදන 2018 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 11 මූලික නිර්දේශ ප්‍රකාරව ක්‍රමක්ෂය වටිනාකම සමාලෝචිත වර්ෂයේ විලම්භිත ආදායම ලෙස ගිණුම්ගත කර ඇත. | ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කල යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමවල සමාජිකයන් විසින් 2016 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා කාලය තුල බැංකු ගිණුම්වල තැන්පත් කර තිබුණු රු.2,950,621 ක් වූ වාරික මුදල් සමාජිකයන්ගේ අනන්‍යතාවය හඳුනාගෙන එම කේවල ගිණුම් වලට ගිණුම්ගත කරනු වෙනුවට හඳුනා නොගත් තැන්පතු ලෙස ගිණුම්ගත කර තිබුණි. | අදාළ දායකයින් හඳුනා ගැනීමට හැකිවන පරිදි අවශ්‍ය තොරතුරු සම්පූර්ණ කර ඇති තැන්පතු පමණක් භාර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස රාජ්‍ය බැංකු දැනුවත් කිරීමට බලාපොරොත්තු වේ. | තැන්පතු ශේෂ හඳුනාගෙන සාමාජිකයින්ගේ ගිණුම් වලට බැර කල යුතුය. |
| (ආ) | තොග අයිතම 179 කට අදාලව එකතු වටිනාකම රු.7,907,995 ක් වූ අවසන් තොග ශේෂය තුල භාවිතයට නොගන්නා තොග අයිතම 27 ක වටිනාකම ගණනය කර වෙන්කිරිමක් සිදු කර මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි. | 2023 වර්ෂයේ දී ඊට අදාළ ඉවත් කිරීම් කිරීමට කටයුතු කරනු ඇත. | භාවිතයට නොගන්නා අයිතම වෙන්කිරිමක් කර යුතුය. |

### 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 381 | මණ්ඩලයේ මූල්‍ය හා මෙහෙයුම් කටයුතු වෙනුවෙන් බැංකු ජංගම ගිණුම් 04 ක් සහ ඉතිරිකිරීම් ගිණුම් 03 ක් 2003-2021 කාල පරාසය තුල ආරම්භ කර තිබුණද 2022 දෙසැම්බර් 31 දින වන විටත් ඒ සඳහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. | ඉදිරියේදී ඊට අදාළ අනුමැතිය මහා භාණ්ඩාගාර රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවෙන් ලබාගැනීමට කටයුතු කරනු ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 1996 අංක 17 දරන සමාජ ආරක්ෂණ මණ්ඩල පනත 15(2) වගන්තිය | යම් දායකයෙකුට ප්‍රතිලාභ අහිමි වී ඇති විට මණ්ඩලය විසින් එම දායකයාට දැන්වීමක් නිකුත් කල යුතු වුවත් සමාජිකයන්ගේ තොරතුරු ඇතුලත් දත්ත පද්ධතිය තුලින් නිවැරදි වාර්තා ලබාගැනීමට නොහැකිවීමෙන් 2022 දෙසැම්බර් 31 දිනට 683,903 ක් වූ අක්‍රීය තත්ත්වයට පැවති දායකයන්ට ප්‍රතිලාභ අහිමි වීම පිළිබඳව දැනුම් දී නොතිබුණි. | පද්ධතියක් සකස්කරන තෙක් එක් එක් සාමාජිකයාගේ ගිණුම පරීක්ෂාකර අක්‍රිය බව දැනුවත් කිරීමට ක්‍රමවේදයක් සකස් කිරීමට කටයුතු කරනු ලබයි. | සමාජ ආරක්ෂණ මණ්ඩලය පනත ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ඇ) | 1999 අංක 33 දරණ සමාජ ආරක්ෂණ මණ්ඩලය (සංශෝධන) පනත 22 වගන්තිය | මණ්ඩලයට වහා අවශ්‍ය නොවන මණ්ඩලයේ අරමුදලෙහි ඇති සියලුම මුදල්, අමාත්‍යවරයා විසින් මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව බලය දෙනු ලබන යම් ආකාරයකින් එසේ බලය දෙනු ලබන යම් සුරැකුම්පත් වල ආයෝජනය කල යුතු වුවද එකතු වටිනාකම රු.2,536,179,200 ක ආයෝජනයන් සඳහා එසේ එකඟතාවයක් ලබා ගෙන නොතිබුණි. | මණ්ඩලයේ සියලු අරමුදල් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තුමේන්තුවේ අංක 02/2018 දරණ 2011.11.14 දිනැති භාණ්ඩාගාර ලේකම්ගේ චක්‍රලේඛය අනුව රාජ්‍ය බැංකුවල ස්ථාවර තැන්පතු ලෙස ආයෝජනය කරයි. | සමාජ ආරක්ෂණ මණ්ඩල පනත ප්‍රකාරව කටයුතු කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.419,422 ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.3,594,481 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.3,175,059 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ආදායම වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2017 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම අනුව සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් ක්‍රමයට නව මෘදුකාංග පද්ධතියක් ස්ථාපනය කිරීමට සැලසුම් කර ඒ සඳහා රු.12,511,000 ක් වූ ප්‍රතිපාදන භාණ්ඩාගාරයෙන් ලබාගෙන තිබුණු අතර 2018 දෙසැම්බර් 06 වන දින අදාල ආයතනය සමඟ ගිවිසුම් ගත වී තිබුණි. පසුව 2019 පෙබරවාරි 14 වන දින පලමු සැපයුම් කට්ටලයට අදාලව සියයට 10 ගෙවීමක් ලෙස රු. 1,009,250 ක් ගෙවීම් සිදුකර තිබුණි. දෙපාර්ශවය විසින් වරින් වර වෙනස්කම් සංශෝධනය කරමින් පැවතියද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වර්ෂ 06 ක කාලයක් ගතවී ඇතත් මෙම පරිගණක පද්ධතිය ස්ථාපනය නොකිරීමෙන් මණ්ඩලයේ සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමවල මෙහෙයුම් කටයුතු විධිමත් ලෙස පවත්වාගෙන යාමට නොහැකි වී තිබුණ අතර එම මුදල් කෙටිකාලීන තැන්පතු වශයෙන් ආයෝජනය කර තිබුණි. | පවත්නා ගිවිසුම අවසන් කිරීමටත්, නව පරිගණක පද්ධතියක් මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කිරීමටත්, අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇත. | සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමවල මෙහෙයුම් කටයුතු විධිමත් ලෙස පවත්වාගෙන යාමට පරිගණක පද්ධතිය ස්ථාපනය කල යුතුය. |
| (ආ) | විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම යටතේ සාමාජිකත්වය ලබා තිබුණු සාමාජිකයින් 879,969 දෙනෙකු අතුරින් අක්‍රීය වූ සාමාජිකයින් 683,903 දෙනෙකු සක්‍රීය කිරීමේ වැඩසටහනට පෙර වර්ෂයේදී ලැබී තිබුණු රු. මිලියන 2.2 ක රජයේ ප්‍රතිපාදන වලින් සමාලෝචිත වර්ෂයට අදාල රු.778,000 කින් මෙහෙයුම් වියදම් වශයෙන් රු.40,000 ක් දරා තිබුණි. සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්ම අනුව අක්‍රීය සාමාජිකයින් 5,000 ක් සක්‍රීය කිරීමට සැලැසුම් කලද පෙර වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේදී රු.1,462,576 ක් වැය දරා සාමාජිකයින් 217 ක් පමණක් සක්‍රීය කර තිබුණි. | සම්පූර්ණ ව්‍යාපෘතිය යටතේ මේ වනවිට 347 දෙනෙකු නැවත සක්‍රීය කිරීමටත් 40,628 දෙනෙකු සඳහා අක්‍රීය තත්ත්වය දැනුම් දීමේ ලිපි යොමු කිරීමටත් ඉදිරියටත් එම කටයුතු වඩාත් කාර්යක්ෂමව සිදු කිරීමටත් කටයුතු කරනු ඇත. | අක්‍රීය සාමාජිකයින් සක්‍රීය කිරීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සාමාජිකත්වය අක්‍රිය වීම හෝ සාමාජිකත්වය අවලංගුකර ගැනීම මත සියයට 25 ක් හෝ ඊට වැඩියෙන් වාරික මුදල් ගෙවූ සාමාජිකයන් 8,720 දෙනෙකුට 2016 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා කාලය තුල ගෙවූ වාරික මුදල් රු.212,120,573 ආපසු ලබාගෙන තිබුණි. එම දායකයින් ඉවත්වයාම වෙනුවට දායකත්වය තවදුරටත් පවත්වා ගැනීම වෙනුවෙන් වූ විධිවිධානයක් හා පිළිවෙත් සැලසුම්කර ක්‍රියාත්මක කිරීමට මණ්ඩලය අපොහොසත් වි තිබුණු අතර වාර්ෂිකව දායකයින් විශාල වශයෙන් සාමාජිකත්වය අහෝසි කර මුදල් ආපසු ලබාගැනීමේ ප්‍රවණතාවයක් පැවතුණි. | 2020,2021 සහ 2022 වර්ෂවල රටේ පැවති කොවිඩ් වසංගත තත්වය සහ ආර්ථික අර්බුදය හේතුවෙන් සාමාජිකයන් තම දායක මුදල් ආපසු ලබා ගැනීම සඳහා ඉල්ලීම් කිරීමේ ප්‍රවනතාවය ද වැඩි විය. කෙසේ වුවද එලෙස දායකයින් ඉවත්වයාම වෙනුවට දායකත්වය තවදුරටත් අඛණ්ඩව පවත්වා ගැනීම වෙනුවෙන් විධිවිධාන හා පිළිවෙත් සැලසුම් කර ක්‍රියාත්මක කරයි. | දායකත්වය අඛණ්ඩව පවත්වා ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඈ) | විශ්‍රාම වැටුප් හා ප්‍රතිලාභ යෝජනා ක්‍රම 07 ක් මුලිකවම මණ්ඩලය විසින් ආරම්භකර තිබුණද මණ්ඩලයේ මෙහෙයුම් කටයුතු කළමණාකරණය කිරීමේ දුර්වලතා හේතුවෙන් සමාලෝචිත වර්ෂය වන විට සක්‍රියව ක්‍රියාත්මකව පැවතුණේ සුරැකුම හා ආරස්සාව යන විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම 02 පමණි. එම යෝජනා ක්‍රම 02 සඳහා සාමාජිකයන් 460,800 ක් බඳවාගෙන තිබුණද එයින් සමාලෝචිත වර්ෂය අවසානයට වූ සක්‍රිය සාමාජිකයන් සංඛ්‍යාව 123,295 ක් හෙවත් සියයට 27 ක් වී තිබුණි. ඔප්පුව අනුව ප්‍රතිලාභ අහිමි වූවන් සහ වාරික ගෙවීම් මඟහැරී පවතින දායකයින් පිළිබඳව තොරතුරු කාලීනව ලබා නොගැනීම මත එම පුද්ගලයන්ට පෙර වර්ෂයේදී මෙන්ම අක්‍රියත්වයට පත්වන දායක සංඛ්‍යාවේ ඉහළ තත්ත්වයක් නිරීක්ෂණය වුවද එම තත්ත්වය වැළැක්වීමට අදාල ක්‍රියාමාර්ග ගැනීමට මණ්ඩලය ක්‍රියාකර නොතිබුණි. | යෝජනා ක්‍රම 4 ක් තිරසාර නොවීම මත එම යෝජනා ක්‍රම සඳහා නව සාමාජිකයින් බඳවා ගැනීම අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව නතර කළ අතර බැඳුනු සාමාජිකයින් සඳහා ප්‍රතිලාභ ලබා දීම අඛණ්ඩව නිසි පරිදි සිදු කරනු ලබයි. | අරමුණු ඉටුවන ලෙස කටයුතු කල යුතුය. |

### 3.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ප්‍රධාන කාර්යාලය පවත්වාගෙනයාම සඳහා මණ්ඩලයේ අරමුදලින් රු.මිලියන 195 ක් ගෙවා රාජගිරිය පිහිටි ගොඩනැගිල්ල 2013 වර්ෂයේදී මිලදී ගෙන තිබුණි. ප්‍රසම්පාදන ක්‍රමවේදයන් අනුගමනය කිරීමෙන් තොරව රු.මිලියන 165 ක් වූ රජයේ තක්සේරු වටිනාකම ඉක්මවා වැඩි මිලකට දේපල මිලදී ගැනීම හේතුවෙන් මණ්ඩලයට රු.මිලියන 30ක පාඩුවක් සිදුකර තිබුණ අතර වර්ෂ 10 ක කාලයක් ඉකුත් වී තිබුණ ද , ඊට වගකිව යුතු පාර්ශවයන්ගෙන් පාඩුව ප්‍රතිපූර්ණය කරගෙන නොතිබුණි. | විමර්ශනයක් සිදු කිරීම සඳහා කමිටුවක් පත් කරන ලද අතර, එම විමර්ශන වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම සඳහා 2023.05.10 දින ඉදිරිපත් කල අතර, අධ්‍යක්ෂ මණ්ඩලයේ උපදෙස් හා නීති උපදෙස් ලබාගෙන ඒ අනුව නඩු පැවරීමට නීතිපතිවරයා වෙත භාර දීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර ඇත. | වගකිව යුතු පාර්ශවයන්ට එරෙහිව නෛතික කටයුතු ඉටුකර පාඩුව පූර්ණය කර ගැනීමට කටයුතු කල යුතුය. |